# ලංකා රසායන විද්‍යා ආයතනය
## රසායන විද්‍යා විද්‍යාලය

# රියදුරු (කොන්ත්‍රාත් පදනමින්)

වෘත්තීය සහ අධ්‍යාපන ආයතනයක් වන අප ආයතනයට කාර්යක්ෂම, වගකීම් සහිත පුද්ගලයෙකු 'බහුකාර්ය බස් රියදුරු' ලෙස බඳවාගැනීමට අවශ්‍ය වී ඇත. අදාළ තනතුරට තෝරාගන්නා අය අධ්‍යයන ආයතනයේ බස් රථයෙන් සිසුන් හා නිලධාරීන් ආරක්ෂිතව සහ කාර්යක්ෂම ලෙස ප්‍රවාහනය කිරීම සඳහා වගකිය යුතු අතර, අනෙකුත් පරිපාලන සහ මෙහෙයුම් කාර්යයන්ද ඉටු කළ යුතුය.

➢ පහත සඳහන් රාජකාරි වල නිරත වීමට සිදුවේ

- ආයතනයේ බස් රථය නිසිපරිදි නඩත්තු කිරීම සහ සිසුන් හා නිලධාරීන් නියමිත මාර්ගවල ආරක්ෂිතව සහ ශ්‍රී ලංකාවේ මාර්ග නීති සහ ආරක්ෂක විධි විධාන අනුව ප්‍රවාහනය කිරීම.
- සෑම දිනකම බස් රථයේ රාජකාරි ඇරඹීමට පෙර සහ පසුව රථය පරීක්ෂා කිරීම, මූලික නඩත්තු කටයුතු සහ ගැටළු හඳුනාගැනීම.
- බස් රථය හැමවිටම පිරිසිදු තත්ත්වයේ පවත්වා ගැනීම.
- ගමන් වාර්තා, වේලාවන් හා සිදුවීම් වාර්තා තැබීම/ඉදිරිපත් කිරීම.
- පරිපාලන කාර්යයන්ට සහය වීම (රියදුරු රාජකාරියේ නොයෙදෙන අවස්ථාවලදී) — ලේඛන/ ලිපි බෙදාහැරීම, ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා සහය වීම සහ ආයතනයේ වගකිවයුතු නිලධාරියකු විසින් යොමුකරනු ලබන වෙනත් සාධාරණ රාජකාරිවල නිරත වීම.

➢ **අවශ්‍ය සුදුසුකම්**

- **රියදුරු බලපත්‍රය:** මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කල බස් රථ ධාවනය පිලිබඳ වලංගු රියදුරු බලපත්‍රයක්.
- අවම වශයෙන් බස් රථ ධාවනය සඳහා වසර 5 ක අත්දැකීමක්. අධ්‍යාපන ආයතනයක බස් රියදුරු ලෙස කලින් සේවය කළ අත්දැකීම ප්‍රමුඛතාවක් ලෙස සැලකේ.
- **අධ්‍යාපනය:** අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් හය (6) ක් (සිංහල/දෙමල භාෂාව ඇතුළුව) සහිතව එකවර සමත් වීම.
- **පෞරුෂ ගුණාංග:** විශ්වාසනීය, කලට වේලාවට කටයුතු කරන සහ මනා චරිතවත් ඇති අයකු විය යුතුය. හොඳ සන්නිවේදන හා අන්නොන්‍ය පුද්ගල සම්බන්ධතා හැකියාවන් අවශ්‍ය වේ.

**වයස: අවුරුදු 28 ට වැඩි විය යුතුය.**
**වැටුප්: සාකච්ඡා කර තීරණය කල හැකිය .**
**අනෙකුත් ප්‍රතිලාභ: EPF / ETF දායකත්වය සහ සාමාන්‍ය සේවා වේලාවට අමතරව සේවය කරන අවස්ථාවල අමතර ගෙවීම.**

ඉහත සඳහන් සුදුසුකම් සහ හැකියාවන් ඇති මේ සඳහා උනන්දුවක් දක්වන්නන් තමන් පිළිබඳව නිර්දේශ ලබා දිය හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සඳහන් කළ ඉල්ලුම්පත මෙම දැන්වීමේ සඳහන් තනතුරේ නම ඉහළ වම් කෙළවරේ ලියන ලද ලියුම් කවරයක බහා පහත ලිපිනය වෙත හෝ විද්‍යුත් තැපෑලෙන් (vacancy@ichemc.edu.lk) **2026/ 02/24** වැනි දිනට පෙර ලැබෙන පරිදි එවීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වනු ලැබේ.

ලේඛකාධිකාරී,
ලංකා රසායන විද්‍යා ආයතනය,
341/22, කෝට්ටේ පාර,
වැලිකඩ,
රාජගිරිය.
2026/02/10